**සමන්තුරෙයි ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**--------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**------------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**------------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මැයි 02 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 19 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**-----------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට සමන්තුරෙයි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**--------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**------------------------**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාව ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ රු.53,688 කට වෙන්දේසියෙන් විකුණා තිබූ හා විනාශ කළ වර්ග 37 ක කාර්යාල ලී බඩු, උපකරණ සහ පුස්තකාල පොත්වල පිරිවැය ගිණුම්වලින් කපාහැර නොතිබුණි.

(ආ) ඒෂියා ෆවුන්ඩේෂන්, සමාජ ආයතන සහ අනෙකුත් පුද්ගලයින් විසින් සමාලෝචිත වර්ෂයේ සභාවේ පුස්තකාලවලට පරිත්‍යාග වශයෙන් ලබා දී තිබූ පොත් 672 ක වටිනාකම රු.476,155 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ සභාවේ බැංකු ගිණුමට ඍජුවම ලැබී තිබුණු එකතුව රු.5,170,258 ක මුද්දර ගාස්තු, පොලී ආදායම් සහ වැටුප් ආපසු ගෙවීම් ආදිය හඳුනා නොගත් තැන්පතු ලෙස දක්වා තිබීම හේතුවෙන් වර්ෂයට අදාළ ආදායම් සහ අතැති මුදල් ආදිය එම වටිනාකමෙන් අඩුවෙන් ඉදිරිපත් කර තිබුණි.

(ඈ) වරිපනම් ගාස්තු අයකිරීම් සම්බන්ධයෙන් ‘k’ ආකෘතිය ප්‍රකාරව ජනවාරි 31 දිනට ප්‍රථම නියමිත වර්ෂයට අදාළ මුළු බදු ප්‍රමාණයම ගෙවූ වරිපනම් බදු හිමියන් සඳහා ගෙවා තිබූ 10% ක වට්ටම් ගිණුම්වලට ඇතුළත් නොකිරීමෙන් ගෙවා තිබූ එම වට්ටම් ප්‍රමාණයෙන් සමුච්චිත අරමුදල් සහ හිඟහිටව පැවති වරිපනම් ආදිය වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් 2014 සහ 2015 වර්ෂවලදී ප්‍රාදේශීය සභාවට ලබා දී තිබූ වාහන 05 ක වටිනාකම, අදාල අමාත්‍යාංශය විසින් ලබා දී තිබූ උපදෙස් අනුව ඒවාහි වෙළඳපොල වටිනාකම රු.61,003,982 ක් ව තිබුණත් මූල්‍ය ප්‍රකාශනවල මෙම වටිනාකම රු.57,695,000 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.3,308,982 කින් ස්ථාවර වත්කම් සහ සමුච්චිත අරමුදල් ආදිය අඩුවෙන් දක්වා තිබුණි.

### 1.3.2 එකඟ නොවූ පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන අනුව වරිපනම් බදු **අයකිරීමේ** ශේෂ සහ එයට සම්බන්ධිත ලේඛන අනුව දක්නට ලැබූ ශේෂවල වටිනාකම් අතර පහත සඳහන් වෙනස්කම් දක්නට ලැබුණි.

| වරිපනම් බදු අයකිරීම | මූල්‍ය ප්‍රකාශන අනුව | වරිපනම් බදු අයකිරීමේ ලේඛන අනුව | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| 2017.01.01 දිනට ශේෂය | 11,749,647 | 16,305,780 | 4,556,133 |
| බිල්කළ ආදායම | 3,887,719 | 4,329,858 | 442,139 |
| 2017.12.31 දිනට ශේෂය | 13,405,363 | 19,362,697 | 5,957,334 |

### 1.3.3 ලැබිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වීථි ලාම්පු විදුලි පරිභෝජනය සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලයෙන් අයකර ගත යුතු ලැබීම් රු.229,705 ක් සම්බන්ධයෙන් අයකරගැනීමට කටයුතු නොකර වර්ෂ 23 කට අධික කාලයක් අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර තිබුණි.

(ආ) අත්තිකාරම් සම්බන්ධයෙන් නිරවුල් කළ යුතු රු.580,277 ක් සඳහා තහවුරු කළ හැකි කිසිඳු ආකාරයක ලේඛන නොමැතිව හා එම අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු නොකර වර්ෂ 14 කට අධික කාලයක් අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර තිබුණි.

### 1.3.4 ලේඛනගත සාක්ෂි නොවීම

සභාව විසින් 2017 වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් 2003 වර්ෂය ප්‍රකාරව ගිණුම් ශේෂ ලෙස ඉදිරියට ගෙන තිබූ එකතුව රු.29,811,585 ක් වූ විෂයයන් 09 ක් සම්බන්ධයෙන් විස්තරාත්මක ලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 1.3.5 නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | 3,535,155 | සභාවේ පරිගනක, පරිගනක උපාංග සහ මෘදුකාංග ලේඛනගත කිරීම සඳහා වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | 815,729 | වර්ෂ දෙකක් ඉක්ම වූ ඉකුත් තැන්පතු 107 ක් අදාළ පුද්ගලයන්ට ලබාදීමට හෝ ආදායමට මාරු කිරීමට කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.10,855,743ක් විය. එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,556,592 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.6,299,150 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට ආදාලව ඉදිරිපත් කර තිබු ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම, රැස්කළ ආදායම හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම් | බිල් කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල් කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය |
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| වරිපනම් හා බදු | 3,888 | 3,902 | 2,246 | 13,405 | 3,888 | 3,888 | 1,539 | 11,750 |
| කුලී | 19,292 | 19,008 | 19,670 | 8,990 | 19,142 | 19,544 | 14,920 | 9,651 |
| බලපත්‍ර ගාස්තු | 900 | 1,231 | 1,231 | - | 800 | 800 | 833 | - |
| අනෙකුත් ආදායම් | 18,153 | 17,078 | 17,078 | - | 17,586 | 11,518 | 11,518 | - |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

2017 දෙසැම්බර් 31 දින දක්වා සභාව විසින් අයකරගත යුතු ආදායම රු.62,620,491 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී රු.40,225,328 ක් අයකරගෙන තිබුණි. මේ අනුව ආදායම් රැස්කිරීමේ ප්‍රතිශතය 64% ක් වශයෙන් දැක්වුණි.

#### 2.2.3 වරිපනම් හා බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ප්‍රදේශවල ඇති ඉඩම් සහ ඉදිකරන ලද නිවාස හා ගොඩනැගිලි මත සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකළ යුතු එකතුව රු.15,637,366 ක වරිපනම් බදුවලින් 14% ක් හෙවත් රු.2,232,002 ක වරිපනම් ගාස්තු පමණක් සමාලෝචිත වර්ෂයේදී අයකර ගෙන තිබුණි.

## 2.2.4 ප්‍රචාරක දැන්වීම් පුවරු සඳහා ගාස්තු අයකිරීම

සමාලෝචිත වර්ෂයේ සභාවේ බල ප්‍රදේශයට අයත් ප්‍රදේශවල පුද්ගලික ආයතන විසින් ස්ථාපිත කළ ප්‍රචාරක දැන්වීම් පුවරු 24 කට අදාළව අයකර ගතයුතු රු.219,061 ක් වටිනා බලපත්‍ර ගාස්තු 2018 සැප්තැම්බර් 14 දින වන විටත් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

## 2.2.5 මස් කඩ බදු දීම්

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ක්‍රියාත්මක වන මස් කඩ බදු දීම් සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මස් කඩ බදු දීමේ ස්ථාන සඳහා ලංසු කැඳවා බදුකරුවන් තෝරා කඩ ලබා දී තිබුණත්, 2018 පෙබරවාරි 10 දින වන විටත් සභාව විසින් බදුකරුවන් සමඟ ගිවිසුම්වලට එළඹ නොතිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයවිය යුතු රු.5,926,648 ක හිඟ බදු අයකර ගැනීම සම්බන්ධයෙන් සභාවට නීතිමය ක්‍රියාමාර්ගයක් ගත නොහැකි තත්ත්වයක් උදා වී තිබූ බව දක්නට ලැබුණි.

(ආ) ලංසු කැඳවීමේ දැන්වීමෙහි 13 වන ඡේදයේ සඳහන් ආකාරයට මස් කඩ බදු මුදල් බදු කරුවන්ගෙන් අයවීම් හිඟ නොමැතිව අයකර ගැනීම සඳහා ඇප ලේඛනයක් ලෙස වරිපනම් ලේඛනයේ ඉතිහාසය දැක්වෙන ලියවිල්ල සහ එහි ඡායා පිටපත් ආදිය ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු මඟින් සනාථ කරමින් ලබාගෙන නොතිබුණි.

(ඇ) මස් කඩ සම්බන්ධයෙන් වගකීම් පවරා ඇති සංවර්ධන නිලධාරීට සමාලෝචිත වර්ෂයේදී ලබා දී තිබූ රාජකාරී ලේඛනය අනුව බදුකරුවන් සමඟ ගිවිසුම්වලට එළැඹීම, ඇප ලේඛන ලබාගැනීම, බදු අයකිරීම් ලේඛනය පවත්වාගෙන යාම සහ හිඟ බදු මුදල් අයකිරීමට කටයුතු කිරීම ආදී කාර්යයන් ඉටුකර නොතිබුණි.

## 2.2.6 පොදු වෙළඳපොල බදුදීම් සහ වෙළඳ කඩකාමර කුලී

පොදු වෙළඳපොල බදු සහ වෙළඳ කඩ කාමර කුලී රු.3,055,860 ක් අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග නොගෙන සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් හිඟ හිටව පැවතුණි.

## 3. මෙහෙයුම් කළමනාකරණය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සහ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබී සභාව විසින් භාවිතා කරනු ලබන වාහන 12 ක් වර්ෂ 02 කට අධික කාලයක සිට සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කාර්යාල ගොඩනැගිලි, මහජන පුස්තකාල, පොදු වෙළඳපොලවල්, මහජන ක්‍රීඩා පිටි, පොදු සුසාන භූමි, කටු ඇඹරීමේ කර්මාන්තශාලාව, ළමා උද්‍යාන, ප්‍රජා මධ්‍යස්ථාන සහ සත්ව ඝාතකාගාරය ආදිය පිහිටි ඉඩම් 48 ක අයිතිය සභාවේ නමට මාරු කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**3.2 මානව සම්පත් කළමනාකරණය**

**---------------------------------**

ප්‍රාදේශීය සභාවේ කම්කරු තනතුරේ සේවකයින් 59 දෙනෙකු ස්ථිර තනතුරු වශයෙන්ද, සේවකයින් 60 දෙනෙකු තාවකාලික, අනියම්, කොන්ත්‍රාත් පදනමින් ද සේවය කරති. එසේ වුවත්, මොවුන්ගෙන් මාර්ග කම්කරු තනතුරේ සිටින අය මුරකරු ලෙස කටයුතු කිරීම හා සෞඛ්‍ය සේවක තනතුරේ කටයුතු කරන අය කාර්යාල කම්කරු තනතුරේ කාර්යභාරයන් ඉටුකිරීම හේතුකොට ගෙන එම සේවකයන් බඳවාගනු ලැබූ නියම තනතුරේ රාජකාරී කටයුතු අංගසම්පූර්ණ ලෙස ඉටු කළ නොහැකි තත්ත්වයක් උද්ගත වී තිබූ බව නිරීක්ෂණය විය.

**4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**-----------------------------------------**

**4.1 නිරවුල් නොකළ විගණන ඡේද**

**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2005 වර්ෂයේදී අතුරුදහන් වූ රු.95,670 ක් වටිනා විදුලි උපකරණ සහ 2015 වර්ෂයේදී අතුරුදහන් වූ රු.35,000 ක් වටිනා කැමරාව සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පාඩුව සඳහා හේතුවද පාඩුව සඳහා වගකිව යුතු අය හඳුනා ගෙන ඔවුන්ට විරුද්ධව විනයානුකූල ක්‍රියාමාර්ග ද ගෙන නොතිබුණි.

(ආ) 1999 වර්ෂයේ ඉදිකළ සභාවේ හිජ්රා පොදු වෙළඳපොලේ පිහිටි කඩ කාමර 84 ක් කුලියට දීම සම්බන්ධයෙන් විගණනයට ලැබී තිබූ ලිඛිත සාක්ෂි අනුව මෙම වෙළඳපොලට ආසන්නයේ පිහිටි පුද්ගලික කඩ කාමර අවම වශයෙන් මාසිකව රු.6,000 සිට රු.20,000 දක්වා පරාසයක කුලී මුදලකට ලබාදෙනු ලැබුවත්, සභාවට අයත් මෙම කඩ කාමර නව මිල ගණන්වලට නොව මාසිකව රු.585 සිට රු.3,335ක් දක්වා පරාසයකින් කුලියට ලබා දී තිබූ බැවින් සභාව ආසන්න වශයෙන් වාර්ෂිකව රු.2,700,000 ක් අහිමි කරමින් පැවතුණි.

**5. පද්ධති හා පාලන**

**------------------**

පහත දැක්වෙන පද්ධති හා ඒ ඉදිරියේ දක්වා ඇති කරුණු කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

| | පාලන ක්ෂේත්‍රය | විශේෂ අවධානය යොමුකළ යුතු කරුණු |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගැනීම. |
| (ආ) | ආදායම් අයකිරීම් පරිපාලනය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම. |
| (ඇ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | කසල වෙන්කර එකතු කිරීම. |